සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**71 S I**

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

# සිංහල I

කාලය පැය තුනයි

- ❖ **පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- ❖ **පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.**

01. පහත දී ඇති ඡේද හා පද්‍ය ඇසුරෙන් අසා ඇති සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.)

(අ) එකල අප බුදුන් සමීපයෙහි එක් කුලයකින් එක් දරු කෙනෙකුන් බැගින් මහණ කරවන සමයෙහි මනානාම නම් ශාක්‍යයෝ තමන් මලණුවන් මෙකී අනුරුද්ධ කුමාරයන් ළඟට කැඳවා ලා 'මලණ්ඩ, බුදුන් කරා ගොස් අප දෙබෑයන් අතුරෙන් එක් කෙනෙකුන් මහණ වුව මැනව, මම මහණ වෙම් ද, තෙපි මහණ වවු දැ'යි විලාළහ. එබසට අනුරුද්ධ කුමාරයෝ කියන්නාහු 'බෑණන් වහන්ස, බුදුන් කෙරේ මහණ වූ කල එක් වේලේ කෑව මනා ල. එසේ වූ බතක් දොර දොර සිඟා ඇවිද ලද මනා ල. බඩසා යයි කියා නො හැකි ල. ඇඹුල් ලුණු බෝය. මඳ යයි කියා නො හැකි ල.

(i) මෙ සමයෙහි වූ විශේෂත්වය කුමක් ද?
(ii) අනුරුද්ධ කුමරු පැවිදි වන්නට අකමැති වූයේ ඇයි?
(iii) 'බඩසායයි කියානො හැකිල' යන්නෙහි අරුත සාමාන්‍ය වහරින් දක්වන්න.
(iv) 'බෑණා' යන්නට විවරණ සපයන්න. (ලකුණු 4)

(ආ) ඒ කිඳුරංගනා තොම රජහු නිරපේක්ෂ ව පලා ගිය නියාව දැන පර්වතයෙන් බැස මහ බෝසත්හු සිප ගෙන ඔසවා පර්වත මුදුනේ ලා බෝධිසත්වයන්ගේ ඉස තමාගේ ඇකයෙහි තබා ගෙන හඬන්නී 'මාගේ ප්‍රිය වූ ස්වාමි පුත්‍රයාණෙනි, පෙර ඔබ හා මා හා පර්වත ගුහායෙහි සිත් සේ ඔවුනොවුන් හා සනහමින් කෙළෙ ඇවිද දැන් නුඹ කෙරෙන් වියෝ වූ මම කුමක් නිසා ළය සනහම් ද? තව ද හිමියනි, පුෂ්ප ඵල පල්ලවයෙන් අලංකෘත වූ වන ලැහැබුන් හා පෙර අප ඇම කෙළෙ ඇවිද සමන් ලියමඬුලු හා බලන්නෙම් තොප නො දැක, අප කෙසේ නම් ඉවසිය හෙම් ද?

(i) කිඳුරියගේ ශෝකය බලවත් වූයේ ඇයි?
(ii) 'රජහු නිරපේක්ෂ ව පලා ගිය නියාව' යන්නෙන් අදහස් කළේ කුමක් ද?
(iii) 'හඬන්නී' යන්නෙහි ව්‍යාකරණ විභාග දක්වන්න.
(iv) 'පුෂ්ප ඵල පල්ලවයෙන් අලංකෘත' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 4)

(ඇ) ජනප්‍රධාන වූ රජ්ජුරුවන් වහන්ස, රන් කැටපතක් මෙන් බබළන්නා වූ ස්ත්‍රීන්ගේ මුහුණ දැල බැඳුණු මසුන් මෙන් චලිත ව ලීලෝපේත වු නේත්‍රයන් ඇත්තේ ද තරුණ හිරු රැස් කළඹක් මෙන් අරුණ වර්ණව ලෙල දිදී දිලිසෙන්නා වූ අධර යුග්මයක් ඇත්තේ ද එබඳු රූපත් වූ මනහර මුහුණු යම් පුරුෂයෙක් සිය ඇස පුරා දැක පී නම් ඒ තෙමේ එවැනි රූප සම්පත්තීන් යුක්ත ස්ත්‍රීන් හීන ජාතියෙහි උපනත් නොහරනේ ම ය'යි කීය. එතෙපුල් අසා 'කිමෙක් ද තා කියන්නේ ය'යි රජ්ජුරුවන් පුළුවුත් කල්හි නැවත කියනුයේ...

(i) හීන ජාතියෙහි උපන් ස්ත්‍රීන් අත් නො හැරීමට හේතුව කුමක්ද?

(ii) මෙහි සඳහන් උපමා දෙකක් සහ උපමේය දෙකක් වෙන් වෙන් ව ලියන්න.

(iii) 'රජ්ජුරුවන් වහන්ස' යන්නෙහි ව්‍යාකරණ ලක්‍ෂණය කුමක් ද?

(iv) 'මුහුණ දැල' යන්නෙහි කාව්‍යාලංකාරය කුමක් ද? (ලකුණු 4)

(ඉ) ලෙළ දෙන නන'වි සි ළු
රද දුම් කඳින් පිහිකු ළු
ඔහු සෙන් ළව'ගර ළු
කෙළේ මොළ රුපු නිරිඳු ඉළු හ ළු

දිමුතු කිතු මුතු හ ර
කර දිගු පියන් පියවු ර
දස රජදම් නොහැ ර
එරජ රජ කරන වර එනුව ර

(i) මෙහි ලෙළ දෙන්නේ මොනවාද?

(ii) රජුගේ සේනාව රූපක කොට ඇත්තේ කුමකට ද?

(iii) 'දිගු පියන් පියවු ර' යන්නෙහි අරුත ලිහිල් බසින් ලියන්න.

(iv) 'මොළ රුපු' හා 'දිමුතු කිතු' යන පදවල අර්ථ ලියන්න. (ලකුණු 4)

(ලකුණු 4x 4 = 16)

(උ) පහත සඳහන් පාඨවල අවස්ථා සම්බන්ධය ලියන්න.

(i) ''හඬන පමණකින් ඇසින් වැගිරෙන කඳුළු දකුත් මුත් උන් දක්නට නැත''

(ii) ''උපයා කැම නම් කර්මාන්ත නම් කෙසේ වූ දෙයක් ද?''

(iii) ''එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නො ඇලෙමි.''

(iv) ''දැන් මට පිළිසරණව සංග්‍රහ කරව''

(v) ''ඉස්සර වෙලා ම කියනව එදා ඒ ගැනි මාත් එක්ක කියපු කතන්දරේ''

(vi) ''නො දත්තෙමු අපි ඒ වග කිසිවක්, මාණවකයිනි සමාව අයදිමු'' (ලකුණු 3 x 4 = 12)

(ඌ) පහත දැක්වෙන පද්‍ය පන්තිය රස වින්දනය කරන්න.

මීසුණු කුසුම් රොන් මුසු නල සුව දැනවි
මේ දුනු රැගෙන එයි මා අබියස මලවි
වාවනු නොහැක නැතිව ද ගී හඬ මලවි
පායනු මැනවි! අඩ හඳ පායනු මැනවි

පිඩු කළ අමා තරුණියකගෙ අදර යුගෙන්
අඩු වැඩි නොකර ගත හැකි බව උගෙන මගෙන්
පඬු පැහැ මවා රන් මුසු කර වැඩිව අගෙන්
උඩු තොල ඇයගෙ පිළිරුවකට රැගෙන නැගෙන්

පටු නළලකට දළැසිහු ඉසි කරන නිසා
ගොටුවක අමා බහමින් වෙල වියන වසා
තුටු කර ඔහුව අප වැනි අය ගැනම අසා
බටු වැනි ඔබත් ලොව පැවතුණ අඳුර නසා

සවසට මුවර දද සහ විත් කිරණ ගලා
සුව දුක් අසා තරුණියකගෙ මුහුණ බලා
මවපන්! නළල ඉන් පසු යන අතර කලා
මුව ඇගෙ මවන හැටි එයි හුරු පුරුදු වෙලා

මගෙ සුන්දරිය කන අබරණ ඉහත තැනූ
පිළිගන්නෙවත් නැත එහෙයින් තරග වෙනු
සුරඹුන් කනට කොයි කවදත් ලකර වුණු
ගනරන් තෝඩුවක හැඩහුරුකමට එනූ

පුන් පියොවුරට තරගයකැයි සිතට දැනී
සුන්දර සුරඹ පෙති පෙති කැපු වියරු ගැනී
රන් තැඹිලියක ඇස්සක් නුබ පතිත විණී
ඉන් ඔබ මැවුණු බව කවියා හොඳට දනී

රූමතියන්ගෙ මුව තඹරට පැරද යතී
දැකැති හදමු කපනට සර වනය නිතී
මේ ගතියකින් සුරඹුවො සුර ලොවෙහි ඇතී
පාදති ඔබව හැඩහුරුකම ගැන ද සිතී

රැටත් වදුලුවල තුරු කොළ විජිනි පතින්
මීකත් තොමෝ මඳ නල දී ඔබගෙ ගතින්
ආයෙත් ගිමන් නිවමින් ඇති හෙයිනි නිතින්
බීමත් වන්න! කුමුදක රස කිරණ විතින් (ලකුණු 12)

02. ලෞකිකත්වයට වඩා ලෝකෝත්තර ජීවිතය පිළිබඳ ඇල්මක් ශ්‍රාවකයා තුළ ඇතිකරලීමේ අරමුණින් පූජාවලිය රචනා කළ බව අනුරුද්ධ කුමාර කතාව ඇසුරින් නිදසුන් දෙමින් විමසන්න.

නැතහොත්

සද්ධර්මරත්නාවලී කතුවරයා ගැමි ජීවන අද්දැකීම් යොදා ගනිමින් රසවත් ව කතා කියූ අයුරු මට්ටකුණ්ඩලී වස්තුව ඇසුරින් පැහැදිලි කරන්න.

03. මනඃකල්පිත සත්ව කොට්ඨාස ඇසුරින් වුව ජාතක කතාකරුවා උත්සාහ දැරුවේ මිනිස් සමාජයට ආදර්ශයක් සැපයීමට ය. චන්ද කින්නර ජාතක කථාව ඇසුරින් පැහැදිලි කිරීමක් කරන්න.

04. අවස්ථා හා සිද්ධි නිරූපණයේ දී ගුත්තිල කවියා දක්වා ඇති ප්‍රතිභාව නියමිත වර්ණනා දෙකක් වත් ඇසුරින් විමසන්න.

05. බැද්දේගම නවකතාවේ සිලිඳුගේ චරිතය පිළිබඳ විමසීමක් කරන්න.

06. කෙටිකතාවේ කථා වින්‍යාසය, චරිතාංග නිරූපණය, භාෂාව හා ජීවන දෘෂ්ටිය පිළිබඳ නිර්දිෂ්ට කෙටිකතා තුනක් වත් ඇසුරින් සාකච්ඡා කරන්න.

07. දරුවන්ට ගෝචර වස්තු තෝරාබේරා ගෙන ඔවුන්ට ම රුචි බසකින් සාර්ථක පද්‍ය රචනා නිර්මාණයෙහි ලා කොළඹ කවියා දැක් වූ සමත්කම නිර්දිෂ්ට පද්‍ය තුනක් ඇසුරින් පෙන්වා දෙන්න.

08. පේමතෝ ජායතී සෝකෝ නාට්‍යයට පාදක වූ පුරාණ මූලාශ්‍රගත කතා පුවත පිළිබඳ විමසුමක යෙදෙන්න.

(02 සිට 08 දක්වා ලකුණු 15 බැගිනි)

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**71 | S | II**

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2019

**Second Term Test - Grade 12 - 2019**

විභාග අංකය .............................

සිංහල II

කාලය පැය තුනයි

- **I කොටසේ 1 ප්‍රශ්නය ද II කොටසේ 2 හා 3 ප්‍රශ්න ද, ඇතුළු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**
- **I ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.**
- **I කොටස II කොටසේ පිළිතුරුපත් සමඟ අමුණා භාර දෙන්න.**

## I කොටස

01. එක් එක් ප්‍රශ්නයට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 ප, ඵ, බ, භ අයත්වන අක්ෂර නාමය වන්නේ,

1. කණ්ඨජාක්ෂර 2. මූර්ධජාක්ෂර 3. දන්තජාක්ෂර
4. තාලුජාක්ෂර 5. ඕෂ්ඨජාක්ෂර (...........)

1.2 අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

1. පොළොන්නරුව, යාපහුව, ලංකාතිලකය, දෙගල්දොරුව.
2. සීගිරිය, දඹුල්ල, දඹදෙණිය, කුරුණෑගල.
3. නුවර, මාතලේ, ලංකාතිලකය, දඹුල්ල.
4. කළුතර, ගංගාරාමය, මහියංගණය, යාපහුව
5. අනුරාධපුර, පොළොන්නරුව, ගඩලාදෙණිය, සීගිරිය. (...........)

1.3 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

1. විශිෂ්ට, ශ්‍රේෂ්ඨ, කණිෂ්ඨ, ජ්‍යෙෂ්ඨ.
2. භෞතික, ලෞකික, භෞමික, වයිදික
3. වෛකල්පික, නෛසර්ගික, සෛද්ධාන්තික, ත්‍රෛයිකාලික.
4. කල්පනා, කාලීන, ඥාණය, දෛනික.
5. ප්‍රශ්නය, වීරෝදාර, තෑගි ප්‍රදානය, විශිෂ්ට (...........)

1.4 පහත සඳහන් වරණ අතුරින් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1. යංශය ස්වරයක් අගට පමණක් යෙදේ.
2. යංශය ස්වර පමණක් නියෝජනය කරයි.
3. යංශය ඕනෑම අකුරක් මුලට පමණක් යෙදේ.
4. යංශය 'ර්' ට පරව යෙදිය හැකි ය.
5. යංශය 'ය' නියෝජනය කරයි. (...........)

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යෙදී ඇති පද පේළිය තෝරන්න.

1. මිහිකත, මැදි විදුහල, මැදුම් පිළිවෙත, අරුත්සුන්
2. සුබ ප්‍රාර්ථනා, ඔසු සල, කලණ මිතුරා, භක්ති කාව්‍ය
3. සෙල් ප්‍රතිමාව, බෞද්ධ සිරිත්, පූර්ණ සටය, රුදු බස
4. විවා මගුල, චෞර සිත, රත්න මැදුර, සූර්ය රශ්මි
5. කල්‍යාණි ගංගා, ක්ෂීර සයුර, සඳහම් රුවන, දකුණු ලක (...........)

1.6 තත්සම වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. තදාසන්න, ජලාශ්‍රිත. දෘෂ්ටිය, පෙරෙවි
2. කෘතිය, දශකය, දුෂ්කර, මුසු
3. ද්විතීයික, දේවස්ථානය, දෘශ්‍යමාන, ඉසුරු
4. ධමනි, හස්ති, වෛද්‍ය, ශීර්ෂ
5. ධර්ම, භාණ්ඩ, භෞතික, තුති (...........)

1.7 තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

1. පසිඳු, යොවුන්, විදෙස්, සමුද්‍රය.
2. කනිටු, මැද, ගත, මංගල්‍යය
3. දස්, පෙර, ලකර, බමන
4. ද්විතීයික, දේවස්ථානය, ඉසුරු, මිශ්‍ර
5. පින්, ධර්ම, සිංහල, අමාත්‍ය (...........)

1.8. විශේෂණ අන්‍යාර්ථ විභක්ති හා අව්‍යය යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.

1. දසබල, දසපනත, දසසිල්, දසදිසා
2. සේනකපඬි, දසබල, කිරිබත්, පබල
3. අපමණ, සුරපුර, මලවි, තුන්දොර
4. දුදන, තිනෙත්, ගුත්තිල, ඇදුරු, නරසී
5. ගල්හිත, එළුමස්, තලතෙල්, සුරපුර (...........)

1.9 කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

1. ලියනු, කියනු, එනු, යනු
2. වැළඳූ, පරදූ, නැටූ, ගැසූ
3. පිසමන්, ලියමන්, කියමන්, සිඟමන්
4. අතුළ, මතුළ, මළ, කර
5. කැවිලි, පෙවිලි, නැටිලි, කැපිලි (...........)

1.10 පහත සඳහන් ක්‍රියා පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(වසිද්දී, බැස, දකිමුවා, බලවයි)

1. ආශිර්වාද ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, විධි ක්‍රියා, පූර්ව ක්‍රියා
2. අසම්භාව්‍ය ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා
3. පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
4. අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා, ආශිර්වාද ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා
5. ප්‍රයෝජ්‍ය ක්‍රියා, විධි ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, පූර්ව ක්‍රියා (...........)

1.11 තද්ධිත පදයක් ඇතුළත් **නොවන** වරණය තෝරන්න.

1. නළලත්, නුවනත්, කොපුලත්, වරලස්
2. අරටු, කැහැටු, වකුටු, ජනතා
3. සිටාණ, දක්ෂතා, විශේෂතා, සුහදතා
4. ඉහටි, පහටි, නාරටි, කරටි
5. රිදීමය, ශිලාමය, කෑවත්, බලවත් (...........)

1.12 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය අයත් වරණය තෝරන්න.

1. අභ්‍යුදය, නිමල, විමල, දුසිරිත්
2. අස්ථිර, ආගමන, විගමන, පරිධිය
3. සුපුන්, අවබල, නිර්මල, ප්‍රතාප
4. අවිනීත, නිර්වින්දන, සුසිල්, අපවාද
5. අපකීර්ති, නිමල, නිදුක්, නිරෝගී (...........)

1.13 නිපාතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

1. විසින්, ගෙන්, මත, ගේ
2. අනේ, අයියෝ, අහා, ඌයි
3. ලෙස, එව, අයුරු, බඳු
4. නිති, ඉක්බිති, යළි. දැක
5. හෙවත්, නොහොත්, හෝ, මිසක් (...........)

1.14 ''<u>වෙියන්ගෙන්</u> සහ <u>කෘමි උවදුරු</u> නිසා ඇති වූ හානිය <u>ගැමි ජනයාට</u> හිරිහැරයකි'' යන්නෙහි ඉරි ඇඳි වචන යෙදී ඇති පිළිවෙළ අයත් වන්නේ මෙයින් කුමන ව්‍යාකරණ අංගවලට ද?

1. සමාස නිපාත හා විභක්ති
2. විභක්ති උපසර්ග හා නිපාත
3. සමාන නිපාත හා තද්ධිත
4. විභක්ති සමාස හා තද්ධිත
5. සමාස තද්ධිත හා නිපාත (...........)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

1. නටමින්, ගයමින්, පිසමින්, ගොස්
2. දමා, ඉස, පැන, නටා
3. බිඳුණේය, කැඩුණාය, වැටුණි, සෑදුවේය.
4. යනු, කනු, බොනු, පිසීමට
5. නටවයි, කරවයි, කඩවයි, රකියි (...........)

1.16 සමාස පදයක් ඇතුළත් නොවන වරණය තෝරන්න.

1. භවදුක, සසර බිය, සසර දුක, වනමල්
2. තිසරණ, පන්සිල්, සිව්සස්, නවදොර
3. කුලය, කුකවි, කුදිටු, කුපුරිස්
4. සුර ලොව, රජ පිරිස, බුදු දහම, කොවුල් නද
5. මව්පිය, අඹුසැමි, ඉරහඳ, ගස්වැල් (...........)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

1. නිලඹර, සිහිනිඟ, මලසුන, පුදසුන
2. ළිංවතුර, ගංවතුර, තම්පලා, මුංපියලි
3. දකුණත, යනෙන, මැදැගිල්ල, ගුරූපදේශ
4. රසාංග, නවාංග, ඔවුනොවුන්. ගුණාගුණ
5. මුනිතුමා, වැටුසිපත, මාර්ගෝපදේශ, ගුරුතුමා (...........)

1.18 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් ඇති වරණය කුමක්ද?

1. අවක්‍රාන්ත, අවලස්සන, අවවාද, අවශේෂ
2. යන එන, ඇඳුම් පැළඳුම්, වතු පිටි, ගී නැටුම්
3. රිදීමය, දාරුමය, රන්මුවා, මිණිමය
4. අරටු, වකුටු, පහළ, පටුන
5. හා, සමඟ, කැටුව, එක්ව (...........)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

1. සමහරු වැඩ කරද්දී විදුලිය ඇණ හිටිණ.
2. ප්‍රදීපයන් දැල්වෙන්නට වූහ.
3. විශ්ව විද්‍යාලයෙහි උගත්තු ඇත.
4. දයාබර පියාණෝ ජාතියෙන් සමු ගත්තේය.
5. රාහුල හිමි කාව්‍යශේඛරය රචනා කළහ. (...........)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

1. ඔයාට කිසිම කරදරයක් නැහැනෙ.
2. අපි ඔක්කොම දැන් පිට්ටනියට යමු නේද?
3. හෙදියන් රෝගීන් බලාගන්න එක හොඳින් කරනවා.
4. පාරිභෝගිකයෝ ඉතා සුපරික්ෂාකාරී ව භාණ්ඩ තෝරා ගනිති.
5. මට අද පොත මාරු කර ගන්න බැරි වෙයි. (...........)

# II කොටස

- **මෙම කොටසින් 2, 3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.**

02. පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

(අ)සිංහල භාෂාව හින්දු යුරෝපීය භාෂා පවුලට අයත් වූවකි. ඉන්දු යුරෝපීය භාෂා පවුල යනු එක ම භාෂාවක් මුල් කොටගෙන විවිධ භාෂා භාවිත කරන ජන කොට්ඨාසයකි. එක ම භාෂාවක් මූලය කරගෙන විකාශනය වී ඇති ජනකොට්ඨාස අතර වුව ද එක ම භාෂාවක් භාවිත කරන ජනතාව තුළ වුව ද ඔවුනොවුන් විසින් ඔවුනොවුනට අවශ්‍ය ආකාරයට ගොඩනගා ගන්නා ලද ආවේණික භාෂා රටාවක් දැකගත හැකි වෙයි. සිංහල ජාතිකයින්ට ආවේණික වූ සිංහල භාෂාව ඊට එක් නිදසුනකි.

මෙසේ එක ම භාෂාවකින් හෝ විවිධ භාෂාවලින් වර්ග වී බෙදී ගොස් ඇති පුද්ගලයන් භාවිත කරන භාෂාව මුල් කරගෙන එකවර්ගයකට අයත් පුද්ගලයන් බව තහවුරු කර ගැනීමට ඔවුන් විසින් තමන්ට ආවේණික ආකාරයට භාෂාව ගොඩනගා ගන්නා ලදී. පසුව විවිධ ජාතීන් වශයෙන් ඔවුහු බෙදී ගියහ. ඊට අමතරව මෙසේ වෙන් වූ එක ජාතිය වුව ද එම කොට්ඨාස අතර වෙන් වී පෙනී සිටීමට දේශපාලන, සාමාජික. සංස්කෘතික. ආර්ථික වැනි දෛනික ජීවන කටයුතු හා සම්බන්ධව පවතින අවශ්‍යතා මෙන් ම ක්‍රියාකාරකම් මුල් කර ගන්නා ලදි. මෙසේ එක ජන කොට්ඨාසයකට අයත් මනුෂ්‍ය සත්වයා ජාතියක් වශයෙන් හෝ එකම ජාතියේ පුද්ගලයන් අතර හෝ වෙන් වී පෙනී සිටීමට පදනම් කොටගෙන ඇත්තේ භාෂාවයි.

1. ඉන්දු යුරෝපීය භාෂා පවුල යන්නෙන් අදහස් කරන්නේ කුමක් ද?
2. එක ම භාෂාවක් භාවිතකරන ජන සමාජයක් තුළ වුව ද භාෂාව කෙරෙහි දක්නට ලැබෙන සුවිශේෂී ලක්ෂණය කුමක් ද?
3. එක ම භාෂාවක් තුළ විවිධ ජන කොට්ඨාස තමන්ගේ අවශ්‍යතා අනුව ගොඩනගාගෙන ඇති භාෂාවකට නිදසුනක් දක්වන්න.
4. එක ම ජාතියකට අයත් මිනිසුන් විවිධ ජන කොට්ඨාසවලට බෙදී යාමට බලපා ඇති සාධක දෙකක් ලියා දක්වන්න.
5. එක් ජන කොට්ඨාසයක් තුළ සුවිශේෂ වූ පුද්ගලයන් ලෙස ඉස්මතු වී පෙනී සිටීමට බලපා ඇති ප්‍රබල උදාහරණය කුමක් ද?
6. මෙම වචනවල අරුත ලියා දක්වන්න.
   (i) ආවේණික (ii) පදනම (ලකුණු 2x 6 = 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා. එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා, සාරාංශය අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

භූ කම්පන මාන පද්ධතියක් භාවිතයෙන් යම් ප්‍රදේශයක ඇතිවන භූමිකම්පා පිළිබඳ අධ්‍යයනය කිරීම ඉතාමත් අපහසු වේ. ඒ සඳහා තම රටෙහි සහ එම රට ආසන්නයෙහි භූමිකම්පා අධ්‍යයනය කිරීමට හැකි වන පරිදි සූක්ෂම භූ කම්පන මානවලින් ද සමන්විත රටට ගැළපෙන භූ කම්පන මාන පද්ධතියක් ස්ථාපිත කර එය කලාපයේ පිහිටි වෙනත් රටවල භූ කම්පන මාන ජාල සමඟ සම්බන්ධ කළ යුතු ය. ඉන් එම කලාපයේ ඇතිවන භූ කම්පා පිළිබඳ හොඳින් අධ්‍යයනය කිරීමට හා නිවැරදි සුනාමි පූර්ව අනතුරු දැනුම්දෙන පද්ධතියක් ස්ථාපිත කිරීමට ද හැකිවේ. මෙවැන්නක් ස්ථාපිත කිරීම ආර්ථික වශයෙන් දැරීමට අපහසු මුදලක් වැය වන කාර්යයක් වුවත් මෙවන් පද්ධතියක් ස්ථාපිත නොකරන තාක් කල් ඇමරිකාවේ භූ

විද්‍යා පර්යේෂණ ආයතනය මගින් නිකුත් කරන භූමිකම්පා පිළිබඳ දැනුම් දීම මත, හවායිවල පිහිටි සුනාමි පූර්ව අනතුරු දැනුම් දෙන ආයතනය මගින් නිකුත් කරන නිවේදන මතින් යැපීමට අපට සිදුවනු ඇත.

2004 වර්ෂයේ දී ලංකාවට බලපාන ලද සුනාමියට හේතු වූ ආකාරයේ විශාල භූමිකම්පා ඇති වීම ඉතාමත් විරල වන අතර, එවන් විශාල ශක්තියක් එකවර පිට කිරීමට ඇති හැකියාව ඉතා අල්ප බැවින්, එවැන්නක් සිදුවීම කාලාන්තරයක් ගත වී සිදුවන සිදුවීමක් ලෙස දැක්විය හැකි ය. සාපේක්ෂ ව කුඩා භූමිකම්පාවක් ඇති වූ විට ද සුනාමි තත්ත්වයක් ඇතිවන අතර, එහි වෙනස රළ පහරට සාපේක්ෂ ව ඉතා කුඩා නිසා අපට නොදැනෙන නමුත්, ස්වාභාවික ව ඇතිවන මෙවන් සිද්ධි වැළැක්වීමට තව ම විද්‍යාව දියුණු නැති අතර, කළ හැකි දෙය වන්නේ, මෙම විපත් ඇතිවීම කලින් පුරෝකථනය කර, එයට සූදානම් වීම පමණි. මෙය අප ඉදිරියේ ඇති අනාගත අභියෝගයයි. (ලකුණු 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළ ව වචන 300 - 350 අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූල ව ලියන්න.

(i) මත් උවදුර රටින් පළවා හැරීම යථාර්ථයක් කර ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ග.
(ii) ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමෙහි ලා ග්‍රාමීය ජනතාව කේන්ද්‍ර කර ගත් වැඩපිළිවෙළක අවශ්‍යතාව.
(iii) මාර්ග තදබදය අවම කිරීමෙහි ලා අධිවේගී මාර්ග ඉදිකිරීමේ යෝග්‍යතාව.
(iv) රසික සිත්වල රසඥතාව බිඳ දමන නව රැල්ලේ ගීත කලාව.
(v) රටේ පවතින ආර්ථික ගැටලු හමුවේ සාමාන්‍ය ජනයා මුහුණ දෙන අභියෝග. (ලකුණු 25)

04. (අ) පහත සඳහන් වාක්‍යවල **සදොස්** තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) අපි සියල්ලන් ම ශ්‍රී ලාංකිකයෝ වෙමු.
(ii) වන සතුන් කුඹුර විනාශ කළහ.
(iii) අම්මා ද මම ද පොළට ගියෙමි.
(iv) ගුරුළුගෝමීහු අමාවතුර ලියුවේය.
(v) සමහර පුෂ්පයන් රාත්‍රියට පිපෙති.

(ආ) පහත සඳහන් වාක්‍ය **කර්මකාරකයට** හරවන්න.

(i) පෙදරේරුවෝ ගොඩනැගිල්ල සාදා නිම කළහ.
(ii) මව දරුවන් රැක්කාය.
(iii) වෙද මහතා රෝගියෙකු සුවපත් කරයි.
(iv) ඇමතිතුමා අප පසසයි.
(v) සාමාජිකයෝ යෝජනා ඉදිරිපත් කරති.

(ඇ) නිවැරදි වැකියක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) හෙට (ඔවුහු/ඔවුන්) එති'යි අපි (නො සිතමු/නො සිතති).
(ii) පියා (දරුවන්/දරුවෝ) ලවා කුඹුර (කොටවයි/කොටවති).
(iii) (දරුවෝ/දරුවන්) අවංක විය (යුතු ය/ යුත්තාහ).
(iv) අපගේ (ගුරුවරු/ගුරුවරුන්) නිරතුරුව ම අපට අවවාද (කරති/කරයි).
(v) (මා/මම) වැනි (ගුරුවරු/ගුරුවරුන්) එදින ආහ. (ලකුණු 5 x 3=15)

05. පහත දැක්වෙන වාක්‍යවල **තද කළු** අකුරින් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) පාසලේ අභිවෘද්ධිය **සඳහා** කටයුතු කිරීමේ දී ගුරු සිසු දෙපිරිස ම විදුහල්පතිතුමාගේ **මාර්ගෝපදේශනය ලබා** ගත යුතු බව අධ්‍යාපන බලධාරීහු පෙන්වා දෙති.
(සඳහා - නිපාත, මාර්ගෝපදේශනය - සන්ධි, ලබා - ක්‍රියා)

(ii) **හද වෙණෙහි** සත්සරය වයන්නට ඔබ **එන්න** අද හෙට **ම**
(හද වෙණෙහි - විභක්ති, එන්න - ක්‍රියා. ම - නිපාත)

(iii) රජය **විදේශාධාර** ලබාගෙන සිදු **කරන අධිවේගී** මාර්ගයේ ඉදිකිරීම් කටයුතු සාර්ථක වේ.
(විදේශාධාර - සන්ධි, කරන- කෘදන්ත, අධිවේගී - අව්‍යය)

(iv) ශ්‍රී ලංකාව මතින් තොර රටක් බවට පත් **කළහොත්** අනාගතයට යහපත් සිසු පරපුරක් දායාද **කළ** හැකි බව සමාජ **හිතවාදීහු** පෙන්වා දෙති.
(කළහොත් - ක්‍රියා, කළ - කෘදන්ත, හිතවාදීහු - විභක්ති)

(v) **මහණුවම්** පුරණු වස් **රහල්තෙර** සසුන්ගත **වී** උදාරතර සාහිත්‍ය සේවයක් ඉටු කළේය.
(මහණුවම් - සන්ධි, රහල්තෙර - සමාස. වී - ක්‍රියා) (ලකුණු 3 x 5 = 15)

06. පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(අ) (මණ්ඩප, ආභාසය, මඬුල්ල, ස්වභාව, අභ්‍යාස)

1. මව්පිය දෙදෙනාගෙන් හා පොතපතින් ලද ............................ නිසා ඔහු උගතෙක් වූවේය.
2. ගස් කොළවලින් ආවරණය වූ ලතා ................ නිසා එම ප්‍රදේශ අලංකාර විය.
3. ඇදුරු ................................ උදය රැස්වීමට පැමිණියහ.
4. දිනපතා ශාරීරික ............................... වල යෙදුණු ක්‍රීඩකයා තරගය ජයග්‍රහණය කළේය.
5. ගස් වැල් .................... ධර්මය මගින් අප ලැබූ වටිනා තිළිණයකි. (1/2 x 6=03)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කරන්න.

(i) නිල් + උපුල් - .......................................... (ii) දඩු + කම් - ...............................................
(iii) කම් + හල - ............................................. (iv) උන් + උන් - ..........................................
(v) පුන + උත් - ............................................. (vi) අති + ඉන්ද්‍රිය - ........................................
(ලකුණු 1/2 x 6 = 03)

(ඇ) තද කළු අකුරින් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **මාර්ටින් වික්‍රමසිංහයෝ ගම්පෙරළිය** රචනා කළහ.
(ii) **මෑණියනි, අපි අසරණයින්ට** පිහිට වෙමු.
(iii) **මිනිසා පොරොවෙන් ගස** කපයි. (ලකුණු 1/2 x 6 = 3)

(ඈ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන වාක්‍ය නැවත ලියන්න.

(i) සීගිරි ගී ක්‍රි ව 8 9 සියවස්වලට අයත් වේ
(ii) අහා කියමින් අම්මා විදේශගතව පැමිණි තම පුතු පිළිගත්තා ය
(iii) අම්මා තාත්තා පෙ ව 7.30 වන විට පාසලට පැමිණෙයි. (ලකුණු 1/2 x 6 = 3)

(ඉ) පහත දැක්වෙන ප්‍රකාශනවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) අපි ලොව වෙනත් කිසිදු තැනක මෙවන් අපූරු නිර්මාණ දැක නැතැ'යි සීගිරිය නැරඹූ සංචාරකයෝ පැවසූහ.

(ii) කැලිකසල තැන තැන නොදමන්නේ නම් පරිසරය අලංකාරව තබා ගත හැකි වෙතැ'යි කසල එක් රැස් කරන්නෝ පවසති.

(iii) මං අද සිට හොඳින් පාඩම් කරනවා යැ'යි සුගත් පැවසුවේය. (ලකුණු 1/2 x 6 =3)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ජලාශ්‍රිත භූමියෙහි සිදු කෙරුණු වී ගොවිතැන ළඟට සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙහි වැදගත් වන්නේ 'හේන් ගොවිතැනයි'. මෙය උතුරු ඉන්දියානු ජනයා මේ දිවයිනට සංක්‍රමණය වීමට පෙර සිට ම මෙරට පැවති ගොවිතැන් ක්‍රමය සේ සැලකිය හැකිය. **වෙහෙරහේන, කොටහේන, තළාහේන, මාහේන, ගිනිගත්හේන** ආදී ස්ථාන නාම ගණනාවක හමුවන 'හේන' යන පදයෙන් පෙන්නුම් කෙරෙනුයේ ඒ ප්‍රදේශවල සාම්ප්‍රදායික හේන් ගොවිතැන දීර්ඝ කාලයක් පවත්වාගෙන ආ බව විය හැකිය. හේන යන්න දෙමළ හුරුවට 'චේන' යනු වී ඇත. වැලිහේන යන්න 'වාලච්චේන' ලෙස දෙමළ වහරට එකතු විය. කැළෑව කොටා එළි පෙහෙළි කොට ගිනි ලා වගාව සඳහා සකස් කළ බිම් ප්‍රදේශයක් 'හේන්' යනුවෙන් හැඳින්වේ. ගොවියා සුබ දිනයක් තෝරා ගස් කැලයට පිවිස, සුදුසු නැකැත් වේලාව අනුව කැත්ත සිරුරට හේත්තු කර ගනිමින්, කැත්තට ද පළමුව කැපීමට තෝරා ගත් පඳුරට ද තෙවරක් නමස්කාර කරයි.

(i) ඡේදයේ තද කළු අකුරින් මුද්‍රිත වචන ආකාරාදී පිළිවෙළට සකස් කර ලියන්න.

(ii) **කෘෂිකර්මාන්තයෙහි, පෙන්නුම් කෙරෙනුයේ** යන වචනවල යෙදී ඇති පිළි වෙන වෙන ම ලියා නම් කරන්න.

(iii) ඉහත ඡේදයෙන් උපුටා දක්වන්න.

1. මූර්ධජ අක්ෂරයක් යෙදුණු වචනයක් ලියන්න.
2. අනුස්වාරයකට පසුව 'ක' වර්ගයේ අකුරකට රකාරාංශය යෙදුණු වචනයක් ලියන්න.
3. මූර්ධජ අක්ෂරයක් හා සඤ්ඤක අක්ෂරයක් එක ළඟ යෙදුනු වචනයක් ලියන්න.

(iv) පහත සඳහන් පද විසන්ධි කර සන්ධි විධිය දක්වන්න.
සාම්ප්‍රදායික, ජලාශ්‍රිත, කැන්න

(v) පහත දැක්වෙන ක්‍රියා වර්ගයට උදාහරණ වචනය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.
පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අවසාන ක්‍රියා. (ලකුණු 3x5=15)

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

(i) ලඝු ස්වර (ii) අල්ප ප්‍රාණ අක්ෂර
(iii) ස්වර සන්ධිය (iv) පූර්ව ක්‍රියා (v) ප්‍රථමා විභක්තිය

(ලකුණු 3 x 5 = 15)

## දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය 2019 - සිංහල I
## පිළිතුරු පත්‍රය - I කොටස

පළමු වැනි ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 5කට පමණක් පිළිතුරු සපයන්න.

01. (අ) (i) එක් කුලයකින් එක් දරුවෙකු මහණ කරවිය යුතු වීම.
(ii) ආහාර පානාදිය නිසි ලෙස නොලැබෙති'යි යන බිය නිසා.
(iii) බඩගිනියි කියලා නොපසුබට/නොපැකිල
(iv) බෑණා යනු සහෝදරයාට යෙදෙන ගෞරවාර්ථ පදයකි. බෑ + ආණ (ලකුණු 4)

(ආ) (i) කිඳුරා මිය ගොස් ඇති බව සිතා/පෙර ඔහු හා විඳි ජීවිතය යළි නොලැබෙන බව සිතා
(ii) රජු බලාපොරොත්තුවක්/අපේක්ෂාවක්/අභිලාෂයක් නොමැතිව නික්ම ගිය බව.
(iii) ස්ත්‍රී ලිංග ආඛ්‍යාතය/ස්ත්‍රී ලිංග කෘදන්ත ආඛ්‍යාතය
(iv) මල් ගෙඩි හා දලුවලින් අලංකාර වූ (ලකුණු 4)

(ඇ) (i) රූපසම්පත්තියෙන් යුක්ත වීම.
(ii) උපමා - රන් කැටපතක් මෙන් උපමේය - ස්ත්‍රීන්ගේ මුහුණ
තරුණ හිරු රැස් කළඹක් මෙන් දිලිසෙන්නා වූ අධර යුග්මය /බබළන දෙතොල්
(iii) ආලපන විභක්තිය/අලප් විබත්
(iv) රූපක/රූපක අලංකාරය (ලකුණු 4යි)

(ඉ) (i) නොයෙක් ආයුධ (ii) ලැව් ගින්නකට
(iii) දිශා නමැති ප්‍රියාවන්ගේ පයෝධර
(iv) මොළ රුපු - චණ්ඩ වූ සතුරු දිමුතු කිතු - දීප්තිමත් කීර්තිය/බබළන යසස
(ලකුණු 4) (මුළු ලකුණු 4 x 4 = 16)

(උ) (i) 'හඬන පමණකින් ඇසින් වැගිරෙන කඳුළු දකුත් මුත් දක්නට නැත.''
සද්ධර්මරත්නාවලියෙහි එන මට්ටකුණ්ඩලී වස්තුවෙහි පුතු මළ සොවින් සොහොනෙහි වැළපෙන බමුණා වෙත පැමිණි මට්ටකුණ්ඩලී දෙව් පුත් බමුණාගේ හැඬීම නිෂ්ප්‍රයෝජන බව පෙන්වා දෙයි. එය අවබෝධ කර ගත් බමුණා මට්ටකුණ්ඩලී දිව්‍ය පුත්‍රයාට මෙසේ පැවසී ය.
(ii) ''උපයා කෑම නම් කර්මාන්ත නම් කෙසේ වූ දෙයක් ද?''
පූජාවලියෙහි එන අනුරුද්ධ කුමාර කථාවේ අනුරුද්ධ කුමරු පැවිදි වීමට අකැමැත්ත ප්‍රකාශ කළ අවස්ථාවේ මහානාම කුමරු තමා පැවිද්දට යන බැවින් උපයා කන හැටි තමාගෙන් ඉගෙන ගන්නා ලෙස පවසයි. එවිට අනුරුද්ධ කුමරු මහානාම කුමරුගෙන් මෙසේ ඇසීය.
(iii) ''එබැවින් මම තිගේ ක්‍රීඩා විනෝදයෙහි නො ඇලෙමි.''
පන්සිය පනස් ජාතක පොතෙහි එන චන්ද කින්නර ජාතිකයෙහි බෝසත් කිඳුරා බරණැස් රජුගේ හී පහරට ලක් වූඅවස්ථාවේ ඉන් වේදනාවට පත් ව කිඳුරිය අමතා කළ ප්‍රකාශයකි.
(iv) ''දැන් මට පිළිසරණව සංග්‍රහ කරව''
සද්ධර්මාලංකාරයෙහි එන ස්වර්ණතිලකා වස්තුවෙහි සිටින උද්දාල බමුණා ස්වර්ණතිලකාගේ රූ සපුවෙන් මත් ව සිය නිවසට ගොස් සිටි අවස්ථාවේ මිතුරන් කැඳවා ඔවුන්ට මෙසේ ප්‍රකාශ කළේ ය.
(v) ''ඉස්සර වෙලා ම කියනව එදා ඒ ගැනි මාත් එක්ක කියපු කතන්දරේ''
ගුණදාස අමරසේකරගේ දිසොන්චිනා හාමි කෙටි කතාවේ සිටින දොස්තර කුමාර් ජයවර්ධන ඇගේ හකු ඇටය ගෙන රෝගය පිළිබඳ පර්යේෂණයක යෙදෙන අවස්ථාවේ රෝග ඉතිහාසය පිළිබඳ කියවා සිය සහකරු බන්ධුසේන අමතා මෙසේ ඇසීය.
(vi) ''නො දත්තෙමු අපි ඒ වග කිසිවක්, මාණවයකයිනි සමාව අයදිමු.''
මහාචාර්ය සරච්චන්ද්‍ර මහතාගේ ප්‍රේමතෝ ජායතී සෝකෝ නාට්‍යයෙහි සිටින සැඩොල් බමුණා (ස්වර්ණතිලකාගේ පියා) ස්වර්ණතිලකා කැටුව උද්දාල බමුණාගේ පාඨශාලාවට පැමිණීම පිළිබඳ සිසුන් ප්‍රශ්න කළ අවස්ථාවේ බමුණා උද්දාලගේ සිසුන් අමතා මෙසේ පැවසී ය. (ලකුණු 3x4 = 12)

(ඌ)පහත දැක්වෙන පද්‍ය පන්තිය රස වින්දනය කරන්න.
අඩ සඳ - මිමන ප්‍රේමතිලක
සොබා දහමේ අපූරු වස්තුවක් වන අඩ සඳ වස්තු කොට ගනිමින් ශෘංගාරාත්මක සිතිවිලි දනවයි. ඒ සඳහා කවියා අනුගමනය කොට ඇති උපාය මාර්ග හා සිව්පද ආකෘතිය, බස්වහර ආදිය ද මනුෂ්‍ය ජීවිතයට සොබා දහමේ බලවේගයන්ට කළ හැකි බලපෑම් පිළිබඳ ජීවන දර්ශනය ආදිය ද විස්තර කෙරෙන සාර්ථක රසවින්දනයකට උපරිම ලකුණු ලබා දෙන්න. (ලකුණු 12)

- 02 සිට 08 දක්වා ඇති ප්‍රශ්නවලට ඉදිරිපත් කර ඇති කරුණුවල අදාළත්වය, උපුටා ගැනීම්වල නිරවද්‍යතාව, තර්කානුකූල බව, විචාරශීලී භාෂා විලාසය, ප්‍රමාණාත්මකව කරුණු ගොනු කිරීම, අත් අකුරුවල පැහිදිලි බව ආදිය සමස්තයක් ලෙස ගෙන ලකුණු ලබා දෙන්න. (ලකුණු 15 බැගිනි)

## 13 ශ්‍රේණිය - සිංහල II

**<u>පිළිතුරු පත්‍රය</u>**

## I කොටස

| | |
|---|---|
| **01.** - 5 | **11.** - 5 |
| **02.** - 4 | **12.** - 2 |
| **03.** - 5 | **13.** - 4 |
| **04.** - 5 | **14.** - 4 |
| **05.** - 1 | **15.** - 2 |
| **06.** - 4 | **16.** - 3 |
| **07.** - 3 | **17.** - 2 |
| **08.** - 2 | **18.** - 4 |
| **09.** - 4 | **19.** - 3 |
| **10.** - 4 | **20.** - 4 |

## II කොටස පිළිතුරු

02. (අ) (i) එකම භාෂාවක් මුල්කරගෙන විවිධ වූ භාෂා භාවිත කරන ජන කොටසකි.

(ii) ඔවුනොවුන් විසින් තම තමන්ට අවශ්‍ය ආකාරයට ගොඩ නගාගත් ආවේණික භාෂා රටාවක් දැක ගත හැකිවීම.

(iii) සිංහල භාෂාව

(iv) දේශපාලනය, සංස්කෘතිය, ආර්ථික කටයුතු, සාමාජික කටයුතු.

(v) ආවේණික - අනන්‍ය වූ ලක්ෂණ

පදනම - ස්ථාවරත්වය

(ආ) සාරාංශය සඳහා ලකුණු 13කි.

03. මාතෘකාවට අදාළව කරුණු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

04. (අ) (i) අපි සියල්ලෝම ශ්‍රී ලාංකිකයෝ වෙමු.

(ii) වන සත්තු කුඹුර විනාශ කළහ.

(iii) අම්මා ද මම ද පොළට ගියෙමු.

(iv) ගුරුළුගෝමීහු අමාවතුර ලියූහ.

(v) සමහර පුෂ්පයෝ රාත්‍රියට පිපෙති.

(ආ) (i) පෙදරේරුවන් විසින් ගොඩනැගිල්ල සාදා නිම කරන ලදී/ලැබිණි. / ලබුණි./නිමකරනු ලැබීය.

(ii) මව විසින් දරුවෝ රකිනු ලැබූහ./ලැබූවෝ ය./ලැබුණ හ.)

(iii) වෙද මහතා විසින් රෝගියෙක් සුවපත් කරනු ලබයි/ලැබෙයි/කෙරෙයි.

(iv) ඇමතිතුමා විසින් අපි පසසනු ලබමු./පැසසෙමු.

(v) සාමාජිකයන් විසින් යෝජනා ඉදිරිපත් කෙරෙයි./කරනු ලබයි/කරනු ලැබෙයි.

(ඇ)(i) ඔවුන්, නොසිතමු. (ii) දරුවන්, කොටවයි.
(iii) දරුවෝ අවංක විය යුත්තාහ. දරුවන් යුතුය (iv) මා, ගුරුවරු.

05. (i) සඳහා - පිණිසාර්ථයේ නිපාත,
මාර්ගෝපදේශනය - ස්වරාදේශ සන්ධිය
ලබා - පූර්ව ක්‍රියා
(ii) හද වෙණෙහි - ආධාර විභක්ති
එන්න - විධි ක්‍රියා
ම - අවධාරණාර්ථයේ නිපාත.
(iii)විදේශාධාර - පූර්ව ස්වර ලෝප සන්ධි.
කරන - වර්තමාන කෘදන්ත.
අධිවේගී - උපසර්ග
(iv)කළහොත් - ආසම්භාව්‍ය ක්‍රියා
කළ - අතීත කෘදන්ත
හිතවාදීහු - ප්‍රථමා විභක්ති
(v) මහණුවම් - ගාත්‍රාදේශ සන්ධි
රහල් තෙර - විශේෂණ සමාස
වී - පූර්ව ක්‍රියා

06. (අ) 1. ආභාසය 2. මණ්ඩප 3. මඩුල්ල 4. අභ්‍යාස 5. ස්වභාව
(ආ)1. නිලුපුල්2. දඩුවම් 3. කම්මල 4. උනුන් 5. පුනරුත් 6. අතීන්ද්‍රිය
(ඇ)(i) ප්‍රථමා විභක්ති. කර්ම විභක්ති. (ii) ආලපන විභක්ති, සම්ප්‍රදාන විභක්ති
(iii) ප්‍රථමා විභක්ති, කරණ විභක්ති

(ඈ)(i) සීගිරි ගී ක්‍රි.ව. 8-9 සියවස්වලට අයත් වේ.
(ii) අහා! කියමින් අම්මා විදේශගත ව පැමිණි තම පුතු පිළිගත්තා ය.
(iii) අම්මා /තාත්තා පෙ.ව. 7.30 වනවිට පාසලට පැමිණෙයි.

(ඉ) (i) තමා ලොව වෙනත් කිසිඳු තැනක මෙවන් අපූරු නිර්මාණ දැක නැති බව සීගිරිය නැරඹූ සංචාරකයෝ පැවසූහ.
(ii) කැලිකසල තැන තැන නොදැමෙයි නම් පරිසරය අලංකාරව තබා ගත හැකි බව කසල එක් රැස් කරන්නෝ පවසති.
(iii) තමා අද සිට හොඳින් පාඩම් කරන බව සුගත් පැවසුවේය.

07. (i) කෙටහේන, ගිනිගත්හේන, තලාහේන, මාහේන, වෙහෙරහේන.
කෘෂිකර්මාන්තයෙහි-

(ii) ගැටපිල්ල, ඉස්පිල්ල, හල් කිරීම. ඇලපිල්ල, හල් කිරීම. කොම්බුව, ඉස්පිල්ල.
පෙන්නුම් කෙරෙනුයේ - කොම්බුව, හල් කිරීම, පාපිල්ල, හල් කිරීම, කොම්බුව, කොම්බුව, පාපිල්ල, කොම්බුව සහ හල් කිරීම.

(iii)1. කෙරුණු, සංක්‍රමණය, දෙමළ (සුදුසු වචනයක් සඳහා ලකුණු ලබා දෙන්න)
2. සංක්‍රමණය 3. ළඟට

(iv)සාම්ප්‍රදායික - සාම්ප්‍රදාය + ඉක - පූර්වස්වර ලෝප සන්ධි
ජලාශ්‍රිත - ජල + ආශ්‍රිත පූර්වස්වර ලෝප සන්ධි
කැත්ත - කැති + අ - ද්විත්ව රූප

(v) පූර්ව ක්‍රියා - තෝරා, කොටා, කොට
මිශ්‍ර ක්‍රියා - ගනිමින්
අවසාන ක්‍රියා - එකතු විය, කරයි.

08. එක් එක් කොටස උදාහරණ කීපයක් සහිතව විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.